**කල්මුණේ මහා නගර සභාව - 2021**
------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කල්මුණේ මහා නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කල්මුණේ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයපථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1 (අ) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2011 – 2015 කාල පරිච්ඡේදය තුල කරෙයිතිවූ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ගාස්තුව රු. 2,046,823 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | | |
| (ආ) සමාලෝචිත වර්ෂයේ කාර්යයන් අවසන් වූ රු. 8,893,624ක් පිරිවැය වූ ඉදිකිරීම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | | |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ මස් කඩකාමර කුලී ආදායම් රු. 2,249,000ක් මූල්‍ය ප්‍රකාශනවල රු.3,985,000ක් ලෙස දක්වා තිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂයේ ගිණුම් වාර්තාවල නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඈ) ලැබිය යුතු මුද්දර ගාස්තු රු.50,116,068 ක් සහ උසාවි දඩ ගාස්තු රු.4,530,551ක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | | |
| (ඉ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් භාරදුන් රු.1,280,500ක් පිරිවැය වූ මාර්ගයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | | |

| | | |
|---|---|---|
| (ඊ) සමාලෝචිත වර්ෂයේ අයකළ මාළු වෙළෙඳ පොල බදුකුලී ආදායම් රු.6,115,000 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.10,000ක් ලෙස දක්වා තිබුණි. | ඉතිරිය නැවත පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | - එම - |

**1.6.2** නොසැසඳූ පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනෙකුත් විවිධ ණයහිමියෝ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය සහ ලේජරය අනුව ශේෂය අතර රු. 1,518,335ක වෙනසක් පැවැතුණි. | පොත්පත් නිවැරදි කර ඉදිරි මූල්‍ය වර්ෂයේදී ගිණුම් නිවැරදි කරනු ලැබේ. | නිවැරදි වටිනාකම් ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

**2** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.5,123,295 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 4,368,372 ක් විය.

**2.2** **මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් 03 ක රු.691,098 ක් පැවති අතර ඒවා වර්ෂය තුල ප්‍රයෝජනයට ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | ප්‍රයෝජනයට ගැනීමට හෝ ආදායමට මාරු කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රයෝජනයට ගැනීමට හෝ පොදු ගිණුමට මාරු කිරීමට කටයුතු කළයුතුය. |

2.3 **ආදායම් පරිපාලනය**

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **වරිපනම් හා බදු** | | |
| වර්ෂය ආරම්භයේ හිඟහිටි වරිපනම් හා බදු රු.83,127,000ක් වූ අතර ඉන් වර්ෂය තුළ අයකිරීම් රු.10,000,000ක් වූයෙන් රු.73,127,000 ක හිඟහිටි ශේෂයක් පැවති අතර ඒවා වර්ෂ 01 සිට 20ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණි. | රටෙහි පැවැති අයහපත් වාතාවරණය හා සේවක පුරප්පාඩු හේතුවෙන් වරිපනම් හා බදු නියමිත කාල පරිච්ඡේදය තුළ අයකළ නොහැකි වී තිබුණි. | ආදායම් කඩිනමින් අයකර ගතයුතුය. |

(ආ) කුලී
-----

| | | | |
|---|---|---|---|
| (i) | කල්මුණේ පොදු වෙළෙඳ පොල ගොඩනැගිලි සංකීර්ණයේ පිහිටි කඩකාමර කුලියට දීමෙන් කුලී හිමිකරුවන් 588ක ගෙන් අයකළ යුතු රු.11,046,198ක් වර්ෂ 05කට අධික කාලයක සිට අයකිරීමට මහානගර සභාව විසින් පියවර ගෙන නොතිබුණි. | රටෙහි පැවැති අයහපත් වාතාවරණය හේතුවෙන් නියමිත කාල පරාසය තුළ අයකළ නොහැකි විය. | - එම - |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ලංසු කැඳවීම් මත බදු දීමෙන් ලැබිය යුතු බදුකුලී රු. 27,805,368ක් වූ අතර ඉන් රු.25,836,299ක් වර්ෂ 10කට අධික කාලයක සිට අයකිරීමට මහානගර සභාව විසින් පියවර ගෙන නොතිබුණි. | රටෙහි පැවැති අයහපත් වාතාවරණය හේතුවෙන් නියමිත කාල පරාසය තුළ අයකළ නොහැකි විය. | - එම - |
| (iii) | රජයේ බස්නැවතුම් පොළේ පිහිටි කඩකාමර 02ක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට කුලියට දී තිබූ අතර එම මණ්ඩලයෙන් අයවිය යුතු හිඟහිටි කුලී රු.1,070,000ක් වර්ෂ 04කට අධික කාලයක සිට අයකිරීමට මහානගර සභාව විසින් පියවර ගෙන නොතිබුණි. | අයකිරීමට පියවර ගෙන ඇත. | - එම - |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

මහ නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විවරණය, පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කරීම් පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
----------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා බලප්‍රදේශයේ විකුණනු ලැබූ නිශ්චල දේපළ 91ක විකුණුම් වටිනාකම වූ රු.67,180,000 කින් සියයට එකක ගාස්තු රු.671,800 ක් අයකිරීමට මහානගර සභා ආඥා පනතේ (252 පරිච්ඡේදය) 247 (ඉ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර මේ හේතුවෙන් සභාවට ලැබිය යුතුව තිබූ ආදායමක් අහිමි වී තිබුණි. | ඉදිරියේදි අයකිරීමට කටයුතු කරනු ලැබේ. | මහානගර සභා ආඥා පනත ප්‍රකාරව, නිශ්චල දේපළ විකුණුම් වටිනාකම් මත සියයට එකක ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ජල සම්බන්ධතා ලබාදීම සඳහා මහානගර සභා බලප්‍රදේශයට අයත් කොට්ඨාශයන්හි පාරිභෝගිකයින් 315කගෙන් කැනීම් කරනු ලැබූ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා එකතුව රු. 825,500ක් අයකර ගෙන තිබූ නමුත් ඉන් මාර්ග 165ක් විගණන දින වන විටත් මහානගර සභාව විසින් ප්‍රතිසංස්කරණය කර නොතිබුණි. | හාරනු ලැබූ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පියවර ගනු ලැබේ. | හාරනු ලැබූ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පියවර ගත යුතුය. |
| (ඇ) | සභාව සතු සහ සභාව විසින් භාවිතා කරනු ලබන ඉඩම් හා වාහන එකතුව 99ක වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාල කටයුතු දැනට සිදුකරනු ලැබේ. | තක්සේරු කර ගිණුම්ගත කිරීම් කටයුතු කඩිනම් කළයුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහානගර සභා බලප්‍රදේශයේ ගම්මාන 07ක පිහිටි දේපළ ඒකක 3,421ක් සඳහා දේපළ බදු අයකිරීමට "K" ආකෘති පත්‍ර හිමිකරුවන්ට බෙදාහැරීමට විගණන දිනය වන විටත් මහානගර සභාව විසින් පියවර ගෙන නොතිබුණි.<br>එසේම, මහානගර සභාවේ කොට්ඨාශ 23හි දේපළ පැවරීම් කළ දේපළ හිමිකරුවන් 3,495කගේ නම්, එම දේපළ බදු නාම ලේඛනයේ ඇතුළත් කිරීමට කාර්යක්ෂම ක්‍රමවේදයක් විධිමත්ව සිදුකිරීමට මහානගර සභාව විසින් ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් දේපළ පැවරීම් සිදුකළ දේපළ හිමිකරුවන්ගෙන් දේපළ බදු අයකිරීමේදී ගැටළු මතුවී තිබෙන අතර ඒවා නියමිත කාල පරාසය තුළ අයකිරීමේදී කාල ප්‍රමාදයක්ද සිදුවී තිබුණි. | රටෙහි පැවැති අයහපත් වාතාවරණය සහ සේවක පුරප්පාඩු වැනි හේතූන් නිසා නියමිත කාල පරාසය තුළ අයකළ නොහැකි විය. | "K" ආකෘති පත්‍ර ලබාදීමට ක්‍රියාමාර්ග ගත යුතුය. පැවරීම් සිදුකළ දේපළ හිමිකරුවන්ගේ නම් දේපළ බදු නාම ලේඛනයේ ඇතුළත් කිරීමට කාර්යක්ෂම ක්‍රමවේදයක් විධිමත්ව සිදුකිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කල්මුණේ පොදු වෙළෙඳ පොල කඩකාමර කුලියට දීම සම්බන්ධයෙන් මහානගර සභාව එළැඹ තිබූ ගිවිසුමේ 9 වගන්තිය ප්‍රකාරව මාසයකට වඩා අධික කාලයක් අඛණ්ඩව කඩකාමර වසා තබන්නේ නම් ඒ සඳහා හේතු මහානගර සභාවේ නගරාධිපති හෝ කොමසාරිස් හෝ බලය පැවරූ නිලධාරියෙකුට දැනුම් දී අනුමැතිය ලබාගත යුතු වුවද, එලෙස කටයුතු නොකර සභාවේ ඉහළ මහලේ පිහිටි කඩකාමර 55ක් අඛණ්ඩව වසා දමා තිබුණි. | ඉදිරියේදි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කල්මුණේ පොදු වෙළෙඳපොල ගොඩනැගිලි සංකීර්ණයේ පිහිටි කඩකාමර 15ක් සහ පසුව තාවකාලිකව ඉදිකළ කඩකාමර 153ක් වර්ෂ 10කට අධික කාලයක සිට අළුත්වැඩියා කර කුලියට දීමට මහානගර සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අළුත්වැඩියා කර කුලියට දීමට කටයුතු කරනු ලැබේ. | අළුත්වැඩියා කර කුලියට දීමට කටයුතු කළ යුතුය. |